# ඇඩිස් 12

ජගත් ජේ එදිරිසිංහ ලියයි

**"සෙන් බුද්ධාගමේ කියමනක් තියෙනවා තිසල් හෙවණැල්ලට ලැබෙන්නෙත් මිනිහගෙ හැඩ රුවමයි කියල.." පොඩි හාමුදුරුවන් කියන්නේ කඩිසර ලෙස වාහනයට ගොඩ වන අයෝමා දෙස තිසල් ගේ උරහිසට උඩින් බලා සිටිමින් ය. ".. අපි කරන හැම දේකින්ම පිළිබිඹු වෙන්නෙ අපේ හැදියාවමයි තිසල්.." "බිම වැටිච්ච මල් ආපහු අතු අගට යන්නෙ නැහැ කියලා කියමනකුත් සෙන් බුද්ධාගමේ තියෙනවා.." කාමරයෙන් පිටව යන අතරේ උන් වහන්සේ කියනු තිසල්ට හොඳින් ඇසුණි. උන් වහන්සේ අදහස් කළ දේ තිසල්ට හොඳින් වැටහෙයි. මේ සිදුවෙමින් පවතින කිසිවක් නැවත ආපසු හැරවිය නොහැකි ය.**



මේසය මතට වී නොකඩවා නාද දෙන දුරකතනය දෙස අනුර බලා සිටින්නේ කෝපයෙනි. උදෑසන සිට විනාඩියෙන් විනාඩියට නොකඩවා නාද දෙන මේ දුරකතනය පොළවේ ගසන්නට ඇත්නම් යයි වරෙක ඔහුට සිතෙයි.

පෙරදා රැය ගෙවී ගියේද හරි හැටි නින්දක් නැතිව ය. සෑම ඡන්ද කාලයක්ම ගෙවුණේ මේ ආකාරයටම ය.

"සර්.. ෆෝන් එක.." ස්ථානාධිපතිවරයා ගේ කාමරයට කරපොවන අරියරත්න රාළහාමි කියයි.

අනුර අතින් සන් කර ආරියරත්නට දුරකතනය පෙන්වයි. ".. කතාකරල බලනවා.."

ආරියරත්න දුරකතනය අතට ගන්නේ සීරුවෙනි. පොලීසියේ වෙනත් දුරකතන මෙන් නොවේ. මෙය ලොක්කාගේ දුරකතනයයි.

"සර් මන්ත්‍රීතුමා..." රිසිවරය අතින් වසා ගන්නා ආරියරත්න දෑතේම ඇඟිලි වලින් නළල දෙපැත්ත පිරිමදිමින් තමා දෙස බලා සිටිනා ස්ථානාධිපතිවරයා දෙස බලා රහසින් කියයි.

අනුර රිසිවරය අතට ගන්නේ අප්‍රසාදයෙනි.

"ඕඅයිසී ද..?" අනෙක් කෙළවරෙන් ඇසෙන ප්‍රශ්නයට අනුර එක්වර පිලිතුරක් නොදෙයි. ".. ඕඅයිසී නැද්ද අයිෂෙ...?"

".. කතාකරනවා.. " අනුර අප්‍රසාදය යටපත් කරගන්නට තැත්කරමින් පිලිතුරු දෙයි.

"අයිෂෙ අනුර.. මොනාද අයිෂෙ මේ කරන වැඩ.. මං කොයි තරං සැරයක් නං කියල තියෙනවද මගේ මිනිස්සුන්ට නිස්කාරණෙ කරදර කරන්ඩ එපා කියලා.. තමුසෙ ඊයෙත් මගේ සපෝටර්ස්ල දෙන්නෙක් අරගෙන.. මොනාද අයිෂෙ මේ කරන වැඩ..?"

"සර් කා ගැනද මේ කියන්නේ..?" අනුර, ආරියරත්නට ඉවත්ව යන්නට අතින් සන් කරමින් අසයි.

"කා ගැනද..? ඊයෙ රෑ සරණ ෆැක්ටරිය ඉස්සරහදි ගත්ත දෙන්න තමුසෙට මතක නෑ.."

"ඒ දෙන්න අහු වුණේ පෝස්ටර් අලවද්දි.."

"ඒව මගෙ පෝස්ටර්.."

"වෙන්න ඇති සර්.. ඒත් ඒ මිනිස්සු කරමින් හිටියෙ නීති විරෝධි වැඩක්නෙ.. ඒක පැත්තක දාමු.. අපි ඇරෙස්ට් කරන්න ටිකකට කලින් තවත් පෝස්ටර් කාණ්ඩයකට ගහල.. මේ කාණ්ඩෙ අතේ ආයුධත් තිබිල තියෙනවා.. සාමය ආරක්ෂා කරන්ඩ අපට වෙන කරන්නඩ දෙයක් තිබ්බෙ නෑ.."

"අයිෂෙ ඒ මිනිස්සු ඇලෙව්වෙ මගෙ පෝස්ටර්.. ඡන්ද කාලෙ පෝස්ටර් අලවන්නෙ මගෙ මිනිස්සු විතරක් නෙවෙයි... හැම ඡන්දාපේක්ෂකයෙක්ම පෝස්ටර් අලවනවා "

"ප්‍රදේශයේ සාමය ආරක්ෂා කරන එක මගේ වගකීම නේද සර්... මම කිසිම වර්ග කිරීමක් නැතිව පක්ෂෙ මොකද්ද කියල බලන්නැතුව ඊයෙ රෑ පෝස්ටර් අලවමින් හිටිය හැමෝම අත් අඩංගුවට ගත්තා.. ඒ දෙන්න විතරක් නෙවෙයි සර්.. තවත් දහ පාළොස් දෙනෙක්ම.. මේක මගේ ඩියුටි එකනෙ සර්"

"අනුර.. තමුසෙ පුලුවන් නං මට කියල දෙනවා පෝස්ටර් ගහන්නෙ නැතුව ඡන්ද කරන හැටි... නීති පොතේ තියෙන හැම බම්බුවක්ම ඒ හැටියටම ක්‍රියාත්මක කරන්නඩ බෑ ඕයි.. මට ඔය බයිල කතා වැඩක් නෑ.. මගේ මිනිස්සු දෙන්න පැයක් ඇතුළත එළියට දාන්ඩ ඕනෙ... තේරුණා නේද..?"

අනුර රිසිවරය අතැතිව මොහොතක් බලා සිටියි. කෝපයෙන් සිරුර ගිනියම් වනු ඔහුට දැනෙයි. තමා පිළිබඳවම දැනෙන මහා අප්‍රසන්න බව දරා ගත නොහැකි තරමින් ඔහු පීඩාවට පත් කරයි.

"තේරුණා නේද..?"

හොඳින් හුස්මක් ගන්නා අනුර පිළිතුරු දෙයි

"හොඳයි සර්.."

ඔහු රිසිවරය දුරකතනය මත තබා සීනුව නාද කරයි. සාජන් පෙරේරා කාමරයට කර පොවා බලයි.

"සාජන්.. කූඩුවෙ කී දෙනෙක් ඉන්නවද..?"

"පහළොවක් විතර ඉන්නව සර්.. පෝස්ටර්කාන්ඩෙ එකොළොස් දෙනයි.. කුඩ්ඩො දෙන්නයි.. කසිප්පු දෙන්නයි.."

"කූඩුව ඇරල ඇතුලෙ ඉන්න ඔක්කොම එළියට දානවා.."

"සර්...?"

".. ඔක්කොම එළියට දානවා.."

"එතකොට සර් අර හෝටලෙන් අල්ලගෙන ආව කෙල්ලො දෙන්නා.. උන් දෙන්නා බංකුවෙ ඉන්නවා.."

"උන් දෙන්නටත් යන්ඩ කියනවා.. හෙට පාළොස්වක නිසා නිදහස් කළා කියනවා.. ඒකෙන් පිනක් ලැබෙනවා නම් පින් ටික තමුසෙ ගන්නවා.."

000000

දුරකතනය නිවා දමන රණසිංහ සෝපාවේ වාඩි වී දෙකකුල් ටීපෝව මත තබා ගනියි. දැඩි වෙහෙසක් දැනෙයි. දේශපාලනය විසින් තමා වෙත ආරෝපනය කරනු ලැබ ඇති බලාධිකාරය තමා නොමග යවමින් සිටිනවා නොවේ දැයි ඔහුට සිතෙයි. අනෙක් අතට මේ බලය සිය පැවැත්ම තහවුරු කර ගැනීම උදෙසා අත්‍යවශ්‍ය සාධකයක් නොවේදැයි ඔහු සිතින් තර්ක කරයි. සියල්ලන් අභිබවා නැගී සිටින්නට තරම් ශක්තියක් ලැබීමේ අභිමානය සිත කොණක සතුටක් රැස් කරයි.

පිපාසයක් දැනෙයි. පෙරදා රැයේ බිව් මත් පැන් නිසා දෝ හිස කකියයි. ඔහු සේවිකාවට කතා කර සිසිල් බීම වීදුරුවක් ගෙන්වා ගනියි.

නිවස තුළ රජයන්නේ දැඩි පාලුවකි. තමා නුවර යන්නේ යයි කියා වින්ධ්‍යා ලියා තැබූ කඩදාසි කැබැල්ල තවමත් මේසය මත තිබෙණු ඔහුට පෙනෙයි. අල්මාරියේ ඇගේ ඇඳුම් තිබූ තට්ටු දෙකක්ද හිස් බව ඔහු දුටුවේ පෙරදා රැයේදී ය. ඈ බොහෝ දිනකට යළි නොඑන බවට එය සාක්ෂියකි.

ඈ සිටියේ කලකිරීම සිතේ දරාගෙන ය. ඒ බව ඔහු ද දනියි. අකමැත්තෙන් ඇය මෙහි රඳවාගෙන සිටීමේ තේරුමක් නැත. ඇය රඳවාගැනීමේ අවශ්‍යතාවක් ඔහුට ද නැත.

එක අතකින් ඇය මෙහි නොසිටීම හිතට සහනයකි. අයේෂා සම්බන්ධ සිදුවීම් නිසා කැළඹුණ සිත සන්සුන් කර ගැන්මට මේ නිහඬ පරිසරය අවශ්‍ය ය. ඉදිරි පියවර පිලිබඳ ගත යුතු නිගමන කෙරෙහි වඩා නිරවුල්ව සිතන්නට මේ සන්සුන් බව අත්‍යවශ්‍ය ය.

ඔහු නැගිට කාමරයට ගොස් ඇඳේ වැතිරෙයි. වින්ධ්‍යා ගේ සුවඳ මේ කොට්ට වල තවමත් තැවරී ඇත. ඈ පිලිබඳ උපන් අනුකම්පාවකින් ඔහු සිත පිරී යයි. වින්ධ්‍යා තමා හැර යාම පිලිබඳව කෝපයක් ඔහු සිත තුළ ඇති නොවෙයි. ඈ යා යුතුව තිබුණි. තමා වැනි මිනිසකු ඇයට කිසි සේත්ම සුදුසු නොවන බව ඔහු ගේ හෘදය සාක්ෂිය හඬ ගා කියයි. ඒ සත්‍යයට ඉඩ දිය යුතු ය.

රණසිංහ සිය ජංගම දුරකතනයේ අංක කීපයක් ඔබයි.

"අජිත්... පැයකින් විතර එන්න.. වැදගත් දෙයක් කතා කරගන්න තියෙනවා.."

මොහොතකට පෙර ඈතින් ඇසුණ සුළඟේ ඝෝෂාව දැන් බොහෝ ළං වී ඇත. එළියේ වැසි බිඳු පතිත වන හඬ ද ඇසෙයි. වරින් වර ඇසෙන ගිගිරුම් හඬ කන් පුපුරවා දමන්නට තැත් කරන්නා සේ ය. ගිනිගත් කොළඹ නිවාදමන්නට වැටෙන මේ වැස්ස තව බොහෝ වේලාවක් ඇද වැටෙණු ඇති බව නිසැක ය.

000000

"තව පැයක් හමාරක් මේ විදිහට වැස්ස ඇල්ලුවොත් නං වත්තටත් වතුර දායි.." පොඩි නෝනා දොර වෙතින් මෑත්ව නිවස තුළට එන අතර කියයි.

තිසල් පුටුවෙන් නැගිට ජනෙල් තිරය මෑත් කර ඇළ දෙස බලයි. පාර අද්දරට එන තෙක්ම ඇළේ දිය මට්ටම ඉහළ නැග ඇති සැටි ජනේලය තුළින් ඔහුට පෙනෙයි. වේගයෙන් පහළට ගලා යන දිය පහරේ විවිධ දේශපාලන පක්ෂ වලට අයත් පැහැය ඇති ඉටි රෙදි කැබලි ද වෙත් කුනු ගොඩවල් ද පාව යයි. ඇල කණ්ඩියේ වූ කොට්ටම්බා ගස

අනෙක් පිටුවට